# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිඩකරණලදී.

නො. 7,927 — 1932ක්වූ ජූනි මස 2 වෙනි දිනවූ බ්‍රහස්පතින්දා.


## Part IV. — හතරවෙනි කාණ්ඩය.

### උපාධ්‍ය නීති.

**නොතාරිස්වරුන්වීමට ඉල්ලුම්කරන්නන්ගේ ඇතුළත් වීමේ පාඩම් විභාගය සම්බන්ධ දැන්වීමයි.**

සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන් හෝ නොතාරිස් ධූරයේ කටයුතු කෙරීම සඳහා ඒ ධූරයට පත්වීම පිණිස නීතිය ඉගෙණගැණීමට බැඳෙන්ට අවසර ඉල්ලන අයවළුන් සම්බන්ධව පාඩම් විභාගයක් වර්ෂ 1932ක්වූ දෙසැම්බර් මස 5වෙනි දින සහ ඊටපසු දවස්වලත් අධ්‍යාපනාධ්‍යක්ෂකතුමා විසින් කොළඹදී පවත්වනු ලැබේ.

2. විභාගයට පෙණීසිටින්ට ඉල්ලුම්කිරීමට ප්‍රථම එක එක අයැදුම්කරු විසින් අඩුම ගණනෙන් ඊට තුන්මාසයක් කලින් තමා වාසයකරණ පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමාට දැන්වීමක් යවන්ට ඕනෑය. ඒ දැන්වීමෙහි ඉල්ලුම්කරු නොතාරිස් ධූරයේ කටයුතු කිරීමට අදහස්කරගෙන තිබෙන භාෂාව සහ දිස්ත්‍රික්කයත් සඳහන්කළයුතුවත් හැර ඒ ඉල්ලුම්පත්‍රය යවන්ට ප්‍රථම එකී තුන්මාසය ගතවී තිබෙන්ටද ඕනෑය.

3. ඒ ඉල්ලීම්පත්‍ර රෙජිස්ට්‍රාර් ජනරල්තුමා නමට වර්ෂ 1907 අංක 1 ක් ආඥාපණතේ II වෙනි ෂැඩ්‍යුල් ලේඛනයේ දක්වා තිබෙන A ෆෝර්මයේ ප්‍රකාර ඉංග්‍රීසි භාෂාවෙන් ලියනලද්දක් වියයුතුවත් හැර එහි මෙහි පහත පෙනෙන කරුණු සඳහන් කළ යුතුයි:—

(1) ඉල්ලුම්කරු වාසයකරණ ස්ථානය.
(2) ඔහුගේ වයස.
(3) ඉගෙණීම පිණිස බැඳෙන්ට ඔහු අදහස්කරගෙන සිටින අද්වකාත්තැනගේ හෝ පෙරකදෝරු තැනගේ නම.
(4) ඔහු නොතාරිස් ධූරයේ කටයුතුකිරීමට අදහස්කර ගෙන තිබෙන දිස්ත්‍රික්කය සහ භාෂාව.

4. ඒ ඉල්ලුම්පත්‍රයෙහි "Ceylon Postage and Revenue" යන වචන දරණ රුපියල් 10ක මුද්දරයක් අලවා නිසිආකාර අවලංගුකළ යුතුය. තවද (අ) ඉල්ලුම්කරු විසින් ආණ්ඩුවේ ඒජන්ත තුමාට දැන් දැන්වීම ලැබුන බව දන්වා එවූ ලියවිල්ලද; (ආ) ඔහුගේ කල්ක්‍රියාව සහ සුදුසුකම් ගැන සහතික පත්‍රද (ඉන් එකක්වත් අඩුම ගණනේ තුන්මාසයකට වඩා පරණ නොවූ සහතික පත්‍රයක් වියයුතුයි. ඔහු රක්ෂාවක යෙදීසිටි කෙනෙක්නම් අන්තිමට මෙහෙකළ ස්වාමියාගේ සහතික පත්‍රයක්ද ඇමිණිය යුතුයි.) සහ (ඉ) උප්පැන්න සහතිකයද ඒ අයැදුම්පතට අමුනා එවිය යුතුය.

5. ඉල්ලුම්කරුවෝ නොතාරිස් ධූරයේ කටයුතුකිරීමට අදහස්කරගෙණ සිටින භාෂාවෙන් ඔවුන්ගේ අත් අකුරෙන් ලියනලද අයැදුම්පත්‍රද, එකී ඉංග්‍රීසියෙන් ලියනලද අයැදුම්පත්‍ර සමග එවිය යුතුය.

6. වර්ෂ 1932ක්වූ ඔක්තෝබර් මස 25වෙනි දින පස්වරු 2ට ප්‍රථම අයැදුම්පත්‍ර මෙම කන්තෝරුවට ලැබෙන්ට ඕනෑය.

7. තමතමා අඳුන්වාදීම පිණිසත් විභාගයට භාරගැණීමට දෙන අවසරපත්‍ර ලබාගැණීම පිණිසත් ඉල්ලුම්කරුවන් විසින් 1932ක් නොවැම්බර් මස 28වෙනි දින පටන් දෙසැම්බර් මාසයේ 2වෙනි දින දක්වා පෙරවරු 10 සිට පස්වරු 4 දක්වාද දෙසැම්බර් මස 3වෙනි දින පෙරවරු 10 සිට පස්වරු 1ක දක්වාද යන දවස්වලින් කොයිම දවසකදී නුමුත් මෙම කන්තෝරුවට පැමිණිය යුතුයි.

8. විභාගය සම්බන්ධ පාඩම් මෙහි පහත පෙනෙන ලේඛනයේ දක්වනලදුවත් හැර එහි එක එක පාඩමට දෙන ලකුණු ගණන් හා ඒ සම්බන්ධ කාල වක්‍රයද ඇතුළත්කරණලද්දේය.

9. ඉල්ලුම්කරුවෝ ලිපිකිරීමෙන්ද, වාක්‍ය ලිවීමෙන්ද, කියවීමෙන්ද, ව්‍යාකරණයෙන්ද විභාගයට නොපෙනී සිටින්ටනම් ප්‍රාචීනභාෂා සමිතියේ මධ්‍යම හෝ අවසාන විභාගයෙන්ද, එසේ නැතහොත් ලන්ඩන් හෝ මද්‍රාසි සමසත්‍ර ශාස්ත්‍රශාලා වල බී. ඒ. නාමෝපලක්ෂිතවූ අයවිය යුතුය. එසේ සමත්වූ වාවූ ඉල්ලුම්කරුවෝ ඒ බව ඔප්පුකිරීමට ඇති සහතිකපත්‍ර එවිය යුතුය.

සී. කුමාරස්වාමි,
රෙජිස්ට්‍රාර් ජනරල්.

වර්ෂ 1932ක්වූ මැයි මස 30වෙනි දින
කොළඹ රෙජිස්ට්‍රාර් ජනරල් කන්තෝරුවේදීය.

**ඉහත සඳහන්කරණලද ලේඛනය.**

**විභාග පාඩම් නාම සහ ලකුණු.**

| | | සම්පූර්ණ ලකුණු ගණන. |
|---|---|---|
| අංක ගණිතය | .. | 100 |
| ලිපිකිරීම | ලිවීම .. | 50 |
| | හරියාකාර අකුරු යෙදීම .. | 50 |
| වාක්‍ය ලිවීම | .. | 50 |
| කියවීම | .. | 50 |
| ව්‍යාකරණ | .. | 100 |


237——J. N. 19993—120 (5/32)
S 1

කාල වක්‍රය.

| | |
|---|---|
| දෙසැම්බර් 5වෙනි දින | පෙරවරු 9 සිට පෙරවරු 11 දක්වා අංක ගණිතය (සිංහල සහ දෙමළ) |
| | පෙරවරු 11 සිට පෙරවරු 11.30 දක්වා ලිපි කිරීම (සිංහල සහ දෙමළ) |
| | පස්වරු 12.45 සිට පස්වරු 1.45 දක්වා වාක්‍ය ලිවීම (සිංහල සහ දෙමළ) |
| | පස්වරු 2 සිට පස්වරු 3.30 දක්වා ව්‍යාකරණ (සිංහල සහ දෙමළ) |

ඊටපසු දිනවල—කියවීම (සිංහල සහ දෙමළ)

## දිස්ත්‍රික් රෝඩ් කොමිටි පිළිබඳ දැන්වීම.

### තුන්කොට මන්ඩකොන්ඩාන වතුබද පාර.

තුන්කොට මන්ඩකොන්ඩාන පාර සම්බන්ධ (පත්කර සිටින) ස්ථානික සභාවේ (ලෝකල් කොමිටියේ) වාර්තාව ලදින්, වම් 1932ක්වූ ජූනි මස 11වෙනි දින පෙරවරු 10.30ට ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටිය විසින් 1902 වතුබද පාරවල් සම්බන්ධ ආඥාපණතේ 19වෙනි වගන්තියේ ප්‍රකාර කුරුණෑගල මහ ඒජන්තතුමාගේ කන්තෝරුවේදී, ඊට විරුද්ධව යම් කාරනා ඇත්නම් ඒවා විභාගකර එකී රපෝර්තුව පිළිගෙන හෝ, වෙනස්කොට හෝ, ප්‍රතික්ෂේපකොට හෝ ස්ථිරකර, ඉන්පසු යට කී වගන්තියේ නියමකොට තියන පිළිවෙළට ඉහතකී පාර වම් 1931 සිට 32 තුළ අවුරුද්දේ නඩත්තු කෙරීම පිණිස එකී එකී වත්ත වෙනුවෙන් (එනි අයිතිකාර) වැසියන් විසින් ගෙවියයුතු මුදල් කොටස තක්සේරුකරන්ට යෙදෙනවා ඇත.

මෙහි පහත සඳහන් වතු වෙනුවෙන් (එනි අයිතිකාරයන් විසින්) එනි අක්කර ගණනට වැටෙන ප්‍රකාර පාරේ මෙහි සඳහන් කොටසට ගෙවියයුතු මුදල් එනි සඳහන් ප්‍රකාර තක්සේරුකරන්ට යෙදෙනවා ඇත.

| | |
|---|---|
| ආණ්ඩුවෙන් ලැබෙන කොටස .. | රු. 1,354 |
| (වතුවෙනුවෙන්) වැසියන් විසින් ගෙවියයුතු කොටස .. .. | රු. 1,646 |

### 1වෙනි කොටසට—හැතැප්ම ½යි.

| අයිතිකාරයෝ හෝ භාරකාරයෝ. | වතු. | අක්කර. |
|---|---|---|
| මාර්ටින් ප්‍රනාන්දු මහත්මයා | කබලෑගස්අගාර .. | 60 |
| බී. ජේ. ඩබ්ලිව්. සමරකෝන් මහත්මයා | තුන්කොට .. | 44 |
| ජේ. ඒ. ක්‍රිකන්බෙක් මහත්මයා | ඇහැටුගහමුලවත්ත නොහොත් සියඹලාගහමූලවත්ත | 45 |
| එම .. | කොහොඹගහමූලවත්ත | 45 |
| පීටර් වික්‍රමනායක මහත්මයා | වතුගැරගමවත්ත .. | 120 |
| ආර්. ඒ. හෝරන් මහත්මයා | හොරගස්අගාර .. | 25 |
| ඒ. ඇම්. ද සිල්වා, දෙස්තර මහත්මයා | වතුවත්ත .. | 200 |
| එම .. | මිලිසන්ටවත්ත .. | 28 |

### 1වෙනි සිට 2වෙනි කොටසට—හැතැප්ම 1යි.

| | | |
|---|---|---|
| කේ. පී. ඒ. පී ඇස්. සුප්‍ර මානියම් චෙට්ටි | තල්ගහමූලවත්ත .. | 30 |
| ඊ. ඒ. ෆල්ගාඩු .. | දම්පිටියවත්ත .. | 30 |
| ඇම්. සෝසිසා, නෝනා මහත්මී | සියඹලාගහරුප්පෙ .. | 350 |
| සාරා, කෝර්නෙලා, රත්දෙනි, ඇල්බට් පෙරත් රත්දෙනි සහ මේරි නෝනා | මහවත්ත .. | 30 |
| පී. ඇම්. උක්කු බන්ඩා අප්පුහාමි | මාදන්ගහමූලවත්ත සහ පළුගහමූලවත්ත | 40 |
| ඇම්. මලකියස් පීරිස් මහත්මයා | පොතුකොලවිල සහ කහටගහවත්ත | 20 |
| කේ. වී. නාගමනි .. | ඉන්නාවත්ත .. | 25 |
| ඒ. සී. ප්‍රනාන්දු, දෙස්තර මහත්මයා | මානාවේරිය .. | 43 |
| එල්බිනාහාමි .. | එම .. | 34 |
| පීටර් වික්‍රමනායක මහත්මයා | මූකලාන සහ කීන කැලේ | 27 |
| ගේබ්‍රියල් ප්‍රනාන්දු මහත්මයා | පරගහමූලවත්ත .. | 30 |
| ඩබ්ලිව්. ඇස්. ප්‍රනාන්දු .. | ගලවලවත්ත .. | 52 |
| සිංඤිරිමැනිකා සහ රෙවී එකනා | කහටගහවත්ත .. | 21 |
| පී. ඇම්. අප්පුසිංඤෝ අප්පුහාමි සහ විකිරල අප්පුහාමි | රජසන්තක වත්ත .. | 40 |

| අයිතිකාරයෝ හෝ භාරකාරයෝ. | වතු. | අක්කර. |
|---|---|---|
| ඩබ්ලිව්. සන්තියාගු ප්‍රනාන්දු මහත්මයා | දොරවෙවත්ත .. | 60 |

### 1වෙනි සිට 3වෙනි කොටසට—හැතැප්ම 1½යි.

| | | |
|---|---|---|
| වී. පී. ඒ. වික්‍රමරත්න, කෝරලේ ආරච්චි මහත්මයා | බුලත්කන්ද මූකලාන | 57 |
| ජෝන් පී. කදිරවෙල් මහත්මයා | බුදන්කුඹුර .. | 48 |
| ආර්. සිංඤෝ නයිදෙ සහ ආරච්චි නයිදෙ | බක්මීගහමූලවත්ත .. | 21 |

### 1වෙනි සිට 4වෙනි කොටසට—හැතැප්ම 2යි.

| | | |
|---|---|---|
| ඇම්. ඒ. අහමදුලෙබ්බෙ ජැජ්ජියාර් | මදුරසතුරහුමනියා .. | 50 |
| ආර්. ඇම්. ඇස්. ගෝපාල ක්‍රිෂ්ණාපුල්ලේ | දිවුරුම්පොලවත්ත .. | 100 |

### 1වෙනි සිට 5වෙනි කොටසට—හැතැප්ම 2½යි.

| | | |
|---|---|---|
| ඩබ්ලිව්. ඒ. පීරිස් නෝනා මහත්මී | යගත්විල .. | 65 |
| ඇන්. සී. පීරිස් නෝනා මහත්මී | එම .. | 64 |
| ෂන්මුගන් අම්මාල් නෝනා මහත්මී | හබරව .. | 130 |
| ඒ. පී. ඒ. ලෙබ්බෙ සහ උදුමා ලෙබ්බෙ | ඇතුන්ගහකොටුව වත්ත | 21 |
| වානා උදුමා ලෙබ්බෙ .. | එම .. | 50 |
| එම .. | පොල්ගහවෙලවත්ත. | 30 |
| එච්. ඇම්. බන්ඩප්පුහාමි, කපුරුහාමි සහ පොඩි නෝනා | කරඳවිල .. | 25 |
| තම්බිලෙබ්බෙගුරුන්නැහෙලාගේ අහමදුලෙබ්බෙ | කොස්ගහමූලවත්ත .. | 20 |
| පානා උදුමා ලෙබ්බෙ සහ කාසි ලෙබ්බෙ | ඉන්නාවත්ත නොහොත් පදින්චි වත්ත | 24 |
| ඇස්. අදු සමදු මවුලානා .. | පදින්චි වත්ත .. | 24 |
| පී. ඇල්. දෙන් මිගෙල් අප්පුහාමි සහ බස්තියන් අප්පුහාමි | බෙලිවැටියවත්ත .. | 25 |
| ඒ. ප්‍රනාන්දු සහ පී. ප්‍රනාන්දු | හබන්නවත්ත .. | 22 |
| එච්. ඇම්. උක්කුබන්ඩා කෝරල | දම්පිටියවත්ත සහ ලිඳපිටියවත්ත | 20 |
| එච්. ඇම්. කවනිහාමි .. | කොන්සගහන්නියාය. | 20 |
| ආර්. ඒ. ජුසි අප්පුහාමි, මානෙල්හාමි සහ කනෝනාහාමි | ඇටඹගහවත්ත .. | 29 |
| ඊනා මීරා ලෙබ්බෙ, අයිරා ලෙබ්බෙ, සන්තිසි ලෙබ්බෙ සහ සාරා අම්මා | ඉන්නාවත්ත .. | 20 |
| ඒ. පී. ජයවර්ධන මහත්මයා | තුනගහමූලවත්ත නොහොත් සියඹලාගහමූලවත්ත | 50 |

### 1වෙනි සිට 6වෙනි කොටසට—හැතැප්ම 3යි.

| | | |
|---|---|---|
| ජී. ඒ. යහපත්හාමි .. | පරගහවත්ත .. | 21 |
| ඇම්. පී. පී. ආර්. අරුනාසලම් | බුරියාය .. | 97 |
| ලයනල් ද පොන්සේකා මහත්මයා | කොවුල්වැව .. | 300 |
| ලගනල් ද සිල්වා දෙස්තර මහත්මයා | ගොරුක්ගස්අගාර .. | 275 |

### 1වෙනි සිට 8වෙනි කොටසට—හැතැප්ම 4යි.

| | | |
|---|---|---|
| වී. ඩබ්ලිව්. ඇම්. ගුනසේකර මහත්මයා | කන්ගහමූලවත්ත .. | 22 |
| බී. ඇම්. උක්කුබංඩා හිටපු කෝරාල | ඉන්නාවත්ත නොහොත් පදින්චි වත්ත | 72 |
| චාර්ල්ස් ප්‍රනාන්දු දෙස්තර මහත්මයා | කබලෑගස්අගාරේ .. | 45 |
| ජේ. ඒ. ද සිල්වා .. | එම .. | 90 |
| ඇස්. ඇම්. බන්ඩා විදානේ | ඉන්නාවත්ත .. | 40 |

### 1වෙනි සිට 9වෙනි කොටසට—හැතැප්ම 4½යි.

| | | |
|---|---|---|
| ලියෝ පී. ප්‍රනාන්දු මහත්මයා | තුනගහමූලවත්ත .. | 50 |
| වී. ඒ. වැග්නර් මහත්මයා | පද්මවත්ත .. | 210 |
| ජේ. ඇම්. ද මෙල් නෝනා මහත්මී | හිම්මැලියාගාර .. | 700 |
| වී. ඒ. වැග්නර් මහත්මයා | තිඹිරිගස්පිටිය .. | 350 |
| පී. බී. ඒ. මැක් සහ පුත්‍රයෝ | බෙලිවැටිය .. | 150 |
| එච්. ජේ. පීරිස් නෝනා මහත්මී | ඔබුගස්අගාර .. | 150 |

| අයිතිකාරයෝ හෝ භාරකාරයෝ. | වතු. | අක්කර. |
|---|---|---|
| ඇල්. බී. පීරිස් නෝනා මහත්මි | හොරගස්අගාර .. | 100 |
| ඒ. ඒ. ද සිල්වා මහත්මයා | රුක්අතන .. | 500 |
| එච්. බී. වෝල්ටර් ද සිල්වා මහත්මයා | හිඹුටුවල .. | 42 |
| ඩබ්ලිව්. මැතිව් ප්‍රනාන්දු මහත්මයා | කඩිගමුව .. | 150 |
| ඩබ්ලිව්. ශ්‍රෙෂන් ප්‍රනාන්දු නෝනා මහත්මි | බරම්පොල .. | 73 |
| කොලින් ද සිල්වා සහ රෝලන්ඩ් සී. සෙනෙවිරත්න මහත්වරු | තල්ගස්හේන .. | 30 |
| බී. ඒ. නවරත්න හොනෙහාත් එල්බිනාහාමි | ගොරක්ගස්අගාර .. | 30 |

ලයනල් ෆ්‍රඩිනැන්ඩ්,
ප්‍රධානතැන වෙනුවට.

වර්ෂ 1932ක්වූ මැයි මස 24වෙනි දින
කුරුණෑගල ප්‍රොවින්ෂල් රෝඩ්
කොමිටියේ කන්තෝරුවේදීය.

## දිස්ත්‍රික් රෝඩ් කොමිටිවලට නිලනොලත් සමාජිකයන් තෝරාගැනීම පිළිබඳ දැන්වීමයි.

වර්ෂ 1932, 1933 සහ 1934ටත් නුවරකලාවිය දිස්ත්‍රික්කේ දිස්ත්‍රික් රෝඩ් කොමිටියේ සාමාජික තමට තෝරාගන්ට යෙදුන බී. ඇස්. ආරුමුගම් ප්‍රසිඩ් නොතාරිස් මහතාගෙ ඉල්ලා අස්වීමේ පුරප්පාඩුව සම්පූර්ණ කරගැනීමට වර්ෂ 1932ක් ඉතිරි කොටසයට සහ වර්ෂ 1933ටත් 1934ටත් සාමාජිකයෙක් හැටියට තෝරාගැනීමට ඉල්ලුම්කාරයින් හැටියට ඉදිරියට එන්ට කැමති අයින් සිටිත්නම්, තෝරාගැනීමේ දිනයට අඩුගණනේ දවස් "දශයකට" 10 මත්තෙන් එසේ බැදෙන්ට අදහස්කරන අය අනුරාධපුරේ ප්‍රොවින්සියල් රෝඩ් කොමිටියේ ප්‍රධානතැනට ලියවිලිවලින් දැනුම්දියයුතු බව වර්ෂ 1861ක් නො. 10 දරණ ආඥාපණතේ 26වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙන්ට යෙදුනා ඇත.

ඉහතකී ආඥාපණතේ 35වෙනි වගන්තියේ ප්‍රකාර වර්ෂ 1932ක්වූ ජූනි මස 30වෙනි දින පස්වරු 2ට අනුරාධපුරේ කච්චේරියේදී නුවරකලාවිය දිස්ත්‍රික් රෝඩ් කොමිටියට සාමාජිකයෙක් තෝරාගනු ලැබේ.

සී. ඇල්. වික්‍රමසිංහ,
උ. මැ. ප. ප්‍රොවින්සියල් රෝඩ් කොමිටියේ
ප්‍රධානතැන.

වර්ෂ 1932ක්වූ මැයි මස 30වෙනි දින
අනුරාධපුරේ ප්‍රොවින්සියල් රෝඩ් කොමිටියේදීය.

---

## පානදුරේ සීමා සහිත රුද්‍රිගෝ පවුලේ අසරණ සරණ සමාගමේ 1931කේ අවුරුද්දේ අය වැය ලේඛණය.

| වියදම්. | රු. ශ. | ආදායම්. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|
| | | පොලී. | | |
| ශිෂ්‍යත්ව .. .. .. | 480 0 | බැන්කුවෙන් .. .. | 66 3 | |
| සෙකාල කාසි .. .. .. | 323 0 | හයකරවලින් .. .. | 4,785 43 | 4,851 46 |
| පැන්ෂන් කාසි .. .. | 156 0 | මිනිපිච්ටනියේ පොල්වලින් .. | 20 0 | |
| විශේෂ උපකාර .. .. | 181 50 | එහි තබත්තුව සඳහා අඩුකළා .. | 3 50 | 16 50 |
| සාංවත්සරික දානය .. .. | 256 63 | සාමාජික මුදල් | | 134 15 |
| සාමාන්‍ය වියදම් .. .. | 105 27 | | | |
| ගණන් පරීක්ෂක මහතුන්ට .. .. | 30 0 | | | |
| පවතිනා බඩුවල වටිනාකමින් 10 % අඩුකිරීමෙන් | 21 20 | | | |
| ලාභ පෙනියන ගණන .. .. | 3,448 51 | | | |
| | 5,002 11 | | | 5,002 11 |

## 1931කේ අවුරුද්දේ තත්‍වදර්ශීණ ලේඛණය.

| | රු. ශ. | රු. ශ. | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|---|
| ජී. ඒබ්‍රම් ප්‍රනාන්දු මහත්මයා 1930 ගණන් බැලීම පිණිස. | 30 0 | | ණයට දී තිබෙන මුදල .. | 41,150 0 | |
| විජේසිංහ සෙවුංජ් සහ ද පොන්සේකා මහත්වරු 1931 ගණන් බැලීම පිණිස .. | 30 0 | 60 0 | අයවෙන්ට තිබෙන පොලී එකතුකළා .. | 14,002 11 | 55,152 11 |
| ඉදිරියට ගෙවාතිබෙන පොලී— | | | මිනිපිච්ටනියේ වටිනාකම . | | 500 0 |
| ඇම්. ජේම්ස් ප්‍රනාන්දු .. | 37 28 | | පවතිනා බඩු— 1930 තත්‍වදර්ශීණ ලේඛණයේ ප්‍රකාර .. .. | 106 0 | |
| ඇම්. ඩබ්ලිව්. ප්‍රනාන්දු .. | 4 94 | 42 22 | පාවිච්චිය සඳහා 20% අඩුකළා | 21 20 | 84 80 |
| සමාගමේ වටිනාකම— 1930 තත්‍වදර්ශීන ලේඛනයේ ප්‍රකාර .. | 56,281 39 | | එච්. ඕ. රුද්‍රිගෝ මහත්මයා .. | | 854 52 |
| මේ අවුරුද්දේ ලාභය .. | 3,448 51 | 59,729 90 | නැෂනල් බැංකුවේ ඉතුරු .. | 2,844 14 | |
| | | | මුදල් පොතේ ප්‍රකාර ඉතුරු .. | 396 55 | 3,240 69 |
| | | 59,832 12 | | | 59,832 12 |

කොලින්, ඇස්. රුද්‍රිගෝ,
ගරු. ලේකම් සහ භාණ්ඩාගාරික තැන.

සීමාසහිත රොද්‍රිගෝ පවුලේ අසරණ සරණ සමාගමේ පොත්පත් යනාදිය අප විසින් පරීක්ෂාකර බලනලදී. අපගේ අද දින දැනම දරණ වාර්තාවට අනුව එම සමිතියේ කටයුතු පොත්වල පෙනෙන අන්දමටද අපට දැනගන්ට යෙදුනු අන්දමට කරුණුද ඉහත පෙනෙන ගණන් ලේඛනයේ පෙනියන බවට මෙයින් සහතිකකරමු.

විජේසිංහ සෙවුංජ් සහ ද පොන්සේකා වෙනුවට,
සී. ඩී. ද පොන්සේකා,
ප්‍රසිඩ ගණන් පරීක්ෂක.

වර්ෂ 1932ක්වූ අප්‍රියෙල් මස
26වෙනි දින කොළඹදීය.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.